තමන් මුහුණ පාන ප්‍රවාහන දුෂ්කරතා වලට විසඳුම් ලබාදිය යුතු බවටත්, පොදුවේ රට මුහුණ පා ඇති ආර්ථික දුෂ්කරතා මගහැරවීමට පවතින පාලනය වෙනස් විය යුතු බවටත් ඉල්ලමින්, දිවයින පුරා ගුරුවරුන් හා විදුහල්පතිවරුන් අප්‍රේල් 25, 2022 දින වෘත්තිය ක්‍රියාමාර්ගයකට යන ලදී.

එම ගුරු විදුහල්පති වෘත්තිය ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් අප්‍රේල් 25, 2022 දින රූපවාහිනී රාත්‍රී ප්‍රධාන සිංහල පුවත් විකාශයන් හි සිරස්තල හා පුවත් අන්තර්ගතයන් ඔස්සේ වාර්තා වී තිබුණේ මෙසේයි.

(මෙම දත්ත සටහන සඳහා භාවිතා වී ඇත්තේ අප්‍රේල් 25, 2022 රූපවාහිනී රාත්‍රී සිංහල ප්‍රධාන පුවත් විකාශයන් පමණක් වන අතර, එදින වෙනත් වේලාවන් හි විකාශය වූ පුවත් ඇතැම් විටක මෙම දත්ත වලට වඩා වෙනස් විය හැක.)